**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 විගණනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කිරීම**

--------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 24 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරි වර්ෂයට ගෙවා තිබු වරිපනම් බදු රු.1,732,404 ක් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ලැබීමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සභාවේ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා වර්ෂයට අදාල වරිපනම් බදු ලැබීම් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ආ) දායක මුදල් ගෙවීම් ප්‍රමාදවීම මත සේවක අර්ථසාධක අරමුදල විසින් පනවා තිබු රු.91,060 ක් වන අධිභාර වෙනුවෙන් වෙන්කිරීම් සිදුකර නොතිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඈ) සභාවට අයත් ස්ථාවර ඉදිකිරීම් 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයන්හි ජංගම වත්කම් හා ජංගම වගකීම් තුල වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු.72,751,453 ක ණයගැති ශේෂ හා රු.10,656,474 ක ණයහිමි ශේෂ පැවතිණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

------------------------

මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් ගිණුම් විෂයන් 07 ක ශේෂයන්හි වටිනාකම ඊට අදාල උපලේඛනයන්හි ශේෂ සමඟ නොසැසඳුන අතර, එම නොසැසඳුනු වෙනසෙහි වටිනාකම රු.19,308,784 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2002 වර්ෂයට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට සභාව වෙත අයවිය යුතුව තිබූ උසාවි දඩ මුදල් රු.279,583 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම අවිනිශ්චිත තත්වයක විය.

(ආ) 2005 වර්ෂයේ සිට බදුකරුවන් 17 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ හිඟ බදුකුලී රු.876,437 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුල දී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) 1996 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.11,534,507 ක් සභාව වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2000 වර්ෂයේ සිට 2004 වර්ෂයේ සැප්තැම්බර් 31 දින දක්වා ලංකා විදුලිබල මණ්ඩලය, වෙන්නප්පුව විදුලි ඉංජිනේරු කාර්යාලය වෙතින් ලැබිය යුතු වීථි ආලෝක ප්‍රතිපූර්ණ මුදල වූ රු. 1,167,000 ක් 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයකරගෙන නොතිබුණි.

(ඉ) පළාත් පාලන ආයතන මහා සංගමය විසින් 1999 වර්ෂයේ දී සභාවෙන් ලබාගෙන තිබූ රු. 100,000ක මුදල ආපසු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබූ අතර, 2007 වර්ෂයේ සිට ලැබිය යුතු පොලී මුදල් ගණනය කිරීම ද අත්හැර දමා තිබුණි.

(ඊ) රජයේ විවිධ ආයතනවලින් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු. 13,314,380 ක් තුල 2002 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ලැබිය යුතු රු. 1,029,535 ක මුදල ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සභාවට අයත් ගොඩනැගිලි හා කඩකාමර බදු දීමේදී බදුකරුවන් විසින් ගෙවීම පැහැර හරින ලද රු. 392,903 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) අයවිය යුතු රු.1,323,113 ක සේවක ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන වියදම් හා සැපයුම් ණයහිමියන්ගේ වටිනාකම රු. 10,656,834 ක් විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයයන් 4 කට අදාලව එකතුව රු.298,626,272 ක් වූ ශේෂ, ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.57,251,512 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.61,597,179 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ පිළිවෙලින් රු.42,730,279 ක් හා රු. 26,528,855 ක් වූ මූලධන ආධාර හා රු.91,017,022 ක් හා රු.86,083,268 ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු එකී අතිරික්තය පිළිවෙලින් රු.8,964,769 ක් හා රු. 2,042,766 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.6,922,003ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත හිඟයන් ලෙස වරිපනම් හා බදු රු.මි.24.4 ක්ද, බදු කුලී රු.මි. 2.1 ක්ද හා වෙනත් ආදායම් රු.මි. 175.9 ක්ද පැවතුණි.

### 2.2.2 වරිපනම් බදු

-------------

සමාලෝචිත වර්ෂයේ බිල්කල වරිපනම් බදු මුදල වූ රු. 15,772,205 කින් ආසන්න වශයෙන් සියයට 62 ක ප්‍රතිශතයක් වූ රු. 9,817,688 ක මුදලක් අයකරගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සභාවේ සමස්ථ වරිපනම් බදු හිඟය රු.24,431,535 ක් විය.

### 2.2.3 මුද්දර ගාස්තු

-------------

(අ) පළාත් සභාව විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකරගෙන තිබූ මුද්දර ගාස්තුවලින් 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතුව තිබූ මුද්දර ගාස්තුවල වටිනාකම රු.107,429,016 ක් විය.

(ආ) මුද්දර ගාස්තු ලැබීමේදී ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය විසින් ලැබිය යුතු බවට සහතික කරන මුදලට වඩා අඩු මුදලක් වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. මේ අනුව 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා දල වශයෙන් රුපියල් මිලියන 12 කට වැඩි මුදලක් සභාවට අහිමිවී තිබුණි.

### 2.2.4 උසාවි දඩ

----------

පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ 2002 වර්ෂයට අදාල උසාවි දඩ මුදල්වල වටිනාකම රු.279,583 කි.

**2.2.5 අධිභාර**

---------

සභාවේ හිටපු සභාපති හා ලේකම්වරයාට එරෙහිව විගණකාධිපති විසින් පනවා තිබූ අධිභාර සහතික දෙකකට අදාලව සභාවට රු.1,805,437 ක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

(අ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර බදු ලේඛන අනුව ආදායම රැස්කර නොගෙන අත්හැර දැමූ ව්‍යාපාර ස්ථාන ගණනාවක් සභා බල ප්‍රදේශයේ පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් සභාව වෙත පනවා තිබූ අධිභාර සමාලෝචිත වර්ෂය අවසානයට රු. 47,715 ක් වූ අතර සේවක භාරකාර අරමුදලේ දායක මුදල් ප්‍රමාද කිරීම මත සමාලෝචිත වර්ෂය සඳහා රු. 85,748 ක අධිභාර පනවා තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

2002 වර්ෂයේ දී සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලට ගැනීමට පුද්ගලයන් 04 දෙනෙකු වෙත එක් අයෙකුට රු.150,000 බැගින් රු.600,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණ ද, මෙතෙක් එම ඉඩමෙහි අයිතිය ලබාගැනීමට හෝ එම මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

වාර්ෂික අයවැය ලේඛන වැඩ සටහන් 4 යටතේ රු.4,950,000 ක ප්‍රතිපාදන වෙන්කරදී තිබුණද, අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

**05. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ  අවධානය යොමු  කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය  පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) සේවක ණය  පාලනය

(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය